ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2018 ජුනි 28 වැනි දින |

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2018 අප්‍රේල්

### සමස්ත නිරීක්ෂණ

2018 අප්‍රේල් මාසයේදී ජංගම ගිණුමේ මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පිළිබිඹු වීම මධ්‍යයේ වුවද, ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුම වෙත වූ අඛණ්ඩ ලැබීම් සමඟ ශ්‍රී ලංකාවේ විදේශීය අංශය ශක්තිමත් විය. විශේෂයෙන්ම, 12 වන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුවෙන් ලද ලැබීම්, ව්‍යාපෘති ණය හා අක්වෙරළ බැංකු ඒකක ණය සහ කොළඹ කොටස් වෙළඳපොළෙහි සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන වැනි මූල්‍ය ගිණුම වෙත වූ ඉහළ ලැබීම් 2018 අප්‍රේල් මාසය අවසානයේදී දළ නිල සංචිත ප්‍රමාණය මෙතෙක් පැවති ඉහළම මට්ටම වන එ.ජ. ඩොලර් බිලියන 9.9 මට්ටම කරා ළඟා වීම සඳහා හේතු විය. ජංගම ගිණුමෙහි දැක්වෙන පරිදි අපනයන ආදායම් වර්ධනය අඩු මට්ටමක පවතින අතරතුර ආනයන වියදම වැඩි වේගයකින් ඉහළ යෑම හේතුවෙන් 2018 අප්‍රේල් මාසයේදී වෙළඳ හිඟය පුළුල් විය. කෙසේ වුවද, මාසය තුළදී සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඛණ්ඩව හිතකර වර්ධනයක් වාර්තා කළේය.

## සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2017 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2018 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2017 ජන.-අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2018 ජන.-අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 795 | 795 | 0.0 | 3,569 | 3,784 | 6.0 |
| ආනයන | 1,604 | 1,794 | 11.8 | 6,883 | 7,765 | 12.8 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -809 | -999 | | -3,314 | -3,981 | |
| සංචාරක ඉපැයීම් | 297 (ආ) | 335 (ඇ) | 12.6 | 1,419 (ආ) | 1,647 (ඇ) | 16.1 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 488(ඈ) | 541 | 10.9 | 2,399 (ඈ) | 2,520 | 5.0 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඉ) | 71 | 28 | | 156 | 47 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 166 | 2,692 | | 803 | 3,476 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 103 | 122 | | 385 | 480 | |
| දිගුකාලීන ණය | 63 | 70 | | 418 | 496 | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | 2,500 | | - | 2,500 | |
| විදේශ සෘජු ආයෝජන (ඊ) | - | - | | 193 | 492 | |
| සමස්ත ශේෂය | | | | -344 | 2,036 | |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික

(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2017 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය.

(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2018 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය.

(ඈ) සංශෝධිත


(ඉ) ද්විතීයික සහ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.

(ඊ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස තුන සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ.

### වෙළඳ ශේෂය

පසුගිය මාසයේදී දක්නට ලැබුණු අඩු වීම වෙනස් කරමින් 2018 අප්‍රේල් මාසයේදී වෙළඳ ගිණුමේ හිඟය පුළුල් විය. අපනයන ආදායමේ වර්ධනය නොවෙනස්ව පැවතියදී ආනයන වියදම ඉහළ යෑම වෙළඳ හිඟය පුළුල් වීම සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය. 2018 වසරේ පළමු මාස හතර තුළදී සමස්ත වෙළඳ හිඟය ද පුළුල් විය.

### රූප සටහන 1: මාසික වෙළඳ ශේෂය





මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

2018 අප්‍රේල් මාසයේදී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම, 2017 අප්‍රේල් මාසයේ අපනයන ආදායමට සමානව එ.ජ. ඩොලර් මිලියන 795 ක් ලෙස නොවෙනස් පැවතුණි. කාර්මික අපනයන ආදායමෙහි සුළු වර්ධනයක් පෙන්නුම් කළ ද කෘෂිකාර්මික සහ ඛනිජමය අපනයන ආදායම පහත වැටුණි. කාර්මික අපනයන සැලකූ විට, එළවළු, පලතුරු හා ධාන්‍ය සැකසුම් යටතේ වර්ග කර ඇති පොල් ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ඉහළ යෑම හේතුවෙන් ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයන ආදායම ඉහළ ගියේය. නැව් හා ගුවන්යානා සඳහා භාවිතා කරන ඉන්ධනවල මිල ගණන් ඉහළ යෑම සහ ඉන්ධන අපනයන පරිමාව සුළු වශයෙන් ඉහළ යෑම මධ්‍යයේ වුවද ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය. ටයර් අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන් රබර් නිෂ්පාදිත අපනයනය ඉහළ ගියේය. මීට ප්‍රතිවිරුද්ධව, 2017 ජූනි මාසයට පසුව ප්‍රථම වරට රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම පහත වැටුණි. 2017 අප්‍රේල් මාසයට සාපේක්ෂව 2018 අප්‍රේල් මාසයේදී ඇමෙරිකා එක්සත් ජනපදය සහ සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙත අපනයනය කළ ඇඟලුම්වලින් ලද ආදායම පහළ ගිය ද, යුරෝපා සංගමය වෙත අපනයනය කළ ඇඟලුම් මගින් ලද ආදායමෙහි සුළු වර්ධනයක් පෙන්නුම් කළේය. තවද, 2018 අප්‍රේල් මාසයේදී ප්‍රවාහන උපකරණ අපනයන ආදායම පහත වැටුණු අතර, 2017 අප්‍රේල් මාසයේදී භාණ්ඩ ප්‍රවාහනය සඳහා යොදාගනු ලබන යාත්‍රාවක් අපනයනය කිරීමෙන් වූ පදනම් බලපෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කුළුබඩු, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ පොල් මද ආශ්‍රිත නිෂ්පාදිතවල ක්‍රියාකාරිත්වය පහළ යෑම ද කෘෂිකාර්මික අපනයන පහත වැටීම සඳහා දායක විය. කෙසේ වුවද, මුහුදු ආහාර යටතේ වන සියලුම උප කාණ්ඩ මගින් ලද ආදායම ඉහළ ගිය අතර, සාමාන්‍ය අපනයන මිල ගණන් පහත වැටුණ ද අපනයන පරිමාව ඉහළ යෑම හේතුවෙන් තේ අපනයන ආදායම සුළු වශයෙන් ඉහළ ගියේය. ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය 2018 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකාවේ භාණ්ඩ අපනයනය සඳහා ප්‍රධාන වෙළඳපොළ ලෙස පැවති අතර, එම රටවල් වෙත සිදු කරන ලද අපනයන මුළු අපනයන ආදායමෙන් සියයට 49 ක් පමණ විය.

**රූප සටහන 2: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)

| කාණ්ඩය | 2017 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2018 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2017 ජන.- අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2018 ජන.- අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **594.9** | **601.3** | **1.1** | **2,701.5** | **2,923.3** | **8.2** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 24.9 | 33.5 | 34.5 | 101.4 | 155.0 | 52.9 |
| සත්ත්ව ආහාර | 5.9 | 12.1 | 105.6 | 28.7 | 38.2 | 33.3 |
| රෙදිපිළි හා ඇඟලුම් | 350.5 | 338.6 | (3.4) | 1,626.3 | 1,667.2 | 2.5 |
| එයින් ඇඟලුම් | 330.7 | 316.9 | (4.2) | 1,531.7 | 1,563.5 | 2.1 |
| රෙදිපිළි | 13.5 | 14.8 | 9.8 | 69.0 | 73.0 | 5.8 |
| වෙනත් රෙදිපිළි සැකසුම් | 6.3 | 6.8 | 7.9 | 25.6 | 30.7 | 19.8 |
| රබර් නිෂ්පාදිත | 48.9 | 55.3 | 13.1 | 248.4 | 280.5 | 12.9 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 16.4 | 17.4 | 5.9 | 80.9 | 106.7 | 31.8 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 24.6 | 30.0 | 21.7 | 126.5 | 138.8 | 9.7 |
| ප්‍රවාහන උපකරණ | 27.4 | 6.0 | (78.3) | 66.3 | 34.6 | (47.9) |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 29.5 | 37.7 | 27.8 | 120.1 | 173.2 | 44.2 |
| රසායනික නිෂ්පාදිත | 11.2 | 11.2 | (0.1) | 47.1 | 52.2 | 11.0 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 10.0 | 10.0 | 0.1 | 45.3 | 47.4 | 4.6 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 2.7 | 0.4 | (87.0) | 12.7 | 5.2 | (59.0) |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 8.3 | 10.8 | 29.0 | 49.2 | 52.4 | 6.5 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 6.1 | 5.6 | (8.1) | 23.5 | 26.1 | 11.1 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 7.7 | 11.0 | 42.6 | 35.3 | 47.4 | 34.4 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 2.3 | 1.6 | (31.5) | 10.5 | 9.3 | (11.0) |
| වෙනත් | 18.1 | 20.3 | 11.6 | 79.2 | 89.0 | 12.3 |
| **2.කෘෂිකාර්මික අපනයන** | **195.8** | **190.3** | **(2.8)** | **851.7** | **843.4** | **(1.0)** |
| තේ | 109.1 | 109.6 | 0.5 | 458.2 | 478.1 | 4.3 |
| රබර් | 2.6 | 2.3 | (9.4) | 19.0 | 14.1 | (25.6) |
| පොල් | 24.8 | 22.6 | (8.5) | 115.7 | 100.9 | (12.8) |
| කුළුබඩු | 23.2 | 17.8 | (23.5) | 109.2 | 96.0 | (12.1) |
| එළවළු | 2.7 | 2.3 | (14.7) | 9.6 | 8.7 | (9.4) |
| සකස් නොකළ දුම්කොළ | 2.5 | 2.3 | (6.2) | 10.4 | 11.3 | 8.0 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 12.7 | 10.5 | (17.7) | 45.3 | 41.0 | (9.7) |
| මුහුදු ආහාර | 18.3 | 22.8 | 24.9 | 84.2 | 93.2 | 10.7 |
| **3.ඛනිජ හා වෙනත් අපනයන** | **4.0** | **3.4** | **(13.7)** | **15.8** | **17.1** | **7.8** |
| **මුළු අපනයන** | **794.7** | **795.1** | **0.0** | **3,569.0** | **3,783.7** | **6.0** |


මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

### වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය

2018 අප්‍රේල් මාසයේ ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව අංක දෙකක වර්ධනයක් වාර්තා කරමින් එ.ජ. ඩොලර් මිලියන 1,794 ක් දක්වා ඉහළ ගියේය. මෙම වර්ධනය සඳහා සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන ඉහළ යෑම දායක විය. සිලින්ඩර ධාරිතාව අඩු මෝටර් රථ, දෙමුහුන් රථ සහ විද්‍යුත් මෝටර් රථ ආනයනය කැපී පෙනෙන ලෙස ඉහළ යෑම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ යටතේ වර්ග කර ඇති පෞද්ගලික භාවිතය සඳහා වන රථවාහන ආනයන වියදම ඉහළ යෑම සමස්ත ආනයන වියදමේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. පසුගිය මාස දහය තුළ වාර්තා වූ අඩුම සහල් ආනයන වියදම් මෙම මාසයේදී වාර්තා වුවද, 2017 අප්‍රේල් මාසයට සාපේක්ෂව එහි වර්ධනයක් පැවතුණි. අන්තර් භාණ්ඩ යටතේ වර්ග කර ඇති රත්‍රන් ආනයන වියදම 2018 අප්‍රේල් මාසයේදී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අඛණ්ඩව ඉහළ ගියේය. රත්‍රන් ආනයන ඉහළ යෑමේ ප්‍රවණතාව වැළැක්වීම සඳහා රජය විසින් 2018 අප්‍රේල් 18 සිට රත්‍රන් ආනයනය මත සියයට 15 ක රේගු බද්දක් පනවන ලදී. ඒ අනුව, වසරේ ඉදිරි මාසවලදී රත්‍රන් ආනයන වියදම අඩු වනු ඇතැයි අපේක්ෂිතය. 2018 අප්‍රේල් මාසයේදී යකඩ හා වානේ සහ ඇලුමිනියම් උපාංග ආනයනය ඉහළ යෑම හේතුවෙන් මූල ලෝහ ආනයන වියදම ඉහළ ගියේය. ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ පොහොර ආනයන ඉහළ යෑම ද අන්තර් භාණ්ඩ ආනයන ඉහළ යෑම සඳහා කැපීපෙනෙන ලෙස දායක විය. පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයනය ඉහළ යෑමත් සමඟ ඉන්ධන ආනයන වියදම සුළු වශයෙන් ඉහළ ගිය ද, බොරතෙල් සහ ගල්අඟුරු ආනයනය සැලකිය යුතු ලෙස පහත වැටුණි. මේ අතර, 2018 අප්‍රේල් මාසයේදී රෙදිපිළි ආනයනය පහළ යෑම හේතුවෙන් රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම සුළු වශයෙන් පහත වැටුණි. යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයනය ඉහළ යෑම ආයෝජන භාණ්ඩ ආනයනය ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන්ම දායක වූ අතර, බස් රථ සහ ට්‍රැක්ටර් වැනි වාණිජ කටයුතු සඳහා භාවිතයට ගනු ලබන රථ වාහන ආනයනය ඉහළ යෑම හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයනය ද ඉහළ ගියේය. මේ අතර, මෙම මාසය තුළදී ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය පහත වැටුණු අතර, සිමෙන්ති ආනයනය පහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. 2018 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකාව ප්‍රධාන වශයෙන් භාණ්ඩ ආනයනය කළ රටවල් ලෙස ඉන්දියාව, චීනය, ජපානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ සිංගප්පූරුව පැවති අතර, එම රටවලින් සිදු කළ ආනයන මුළු ආනයන වියදමින් සියයට 59 ක් පමණ විය.

**රූප සටහන 3: මාසික ආනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | 2017 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2018 අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2017 ජන.-අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | 2018 ජන.-අප්‍රේල් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **345.1** | **419.6** | **21.6** | **1,515.6** | **1,780.0** | **17.4** |
| ආහාර හා පාන වර්ග | 123.9 | 126.4 | 2.0 | 629.2 | 652.7 | 3.7 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 11.2 | 15.9 | 42.9 | 114.6 | 105.5 | (7.9) |
| එයින් සහල් | 10.5 | 14.2 | 35.9 | 110.7 | 98.8 | (10.7) |
| මුහුදු ආහාර | 14.2 | 18.2 | 28.5 | 68.7 | 76.8 | 11.8 |
| කිරි නිෂ්පාදිත | 25.6 | 22.1 | (13.6) | 110.4 | 115.3 | 4.4 |
| එළවළු | 22.8 | 20.6 | (9.5) | 124.3 | 119.1 | (4.2) |
| සීනි හා රසකැවිලි | 22.8 | 17.0 | (25.5) | 86.6 | 105.1 | 21.4 |
| කුළුබඩු | 5.6 | 7.8 | 40.6 | 33.0 | 33.2 | 0.7 |
| පාන වර්ග | 6.1 | 7.8 | 27.6 | 25.7 | 24.1 | (6.4) |
| වෙනත් ආහාර හා පාන වර්ග | 15.8 | 17.0 | 7.5 | 65.8 | 73.5 | 11.7 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 221.2 | 293.2 | 32.6 | 886.5 | 1,127.4 | 27.2 |
| රථවාහන | 56.3 | 157.8 | 180.2 | 248.2 | 516.6 | 108.2 |
| බෙහෙත් සහ ඖෂධීය නිෂ්පාදිත | 36.6 | 38.7 | 5.9 | 161.8 | 168.7 | 4.3 |
| විදුලි සංදේශ උපකරණ | 12.5 | 24.0 | 92.4 | 92.3 | 97.0 | 5.1 |
| රෙදිපිළි හා උපාංග | 56.7 | 19.3 | (66.0) | 143.5 | 116.1 | (19.0) |
| ගෘහ උපකරණ | 21.1 | 19.1 | (9.8) | 92.4 | 87.3 | (5.5) |
| ගෘහ හා දැව භාණ්ඩ | 16.9 | 12.6 | (25.1) | 54.0 | 57.2 | 5.9 |
| රබර් නිෂ්පාදිත | 5.8 | 6.9 | 17.5 | 30.8 | 29.8 | (3.4) |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 15.3 | 14.9 | (2.6) | 63.4 | 54.6 | (14.0) |
| **2. අන්තර් භාණ්ඩ** | **885.7** | **978.4** | **10.5** | **3,692.2** | **4,329.8** | **17.3** |
| ඉන්ධන | 325.6 | 326.8 | 0.4 | 1,208.3 | 1,402.0 | 16.0 |
| එයින් බොරතෙල් | 81.5 | 50.4 | (38.2) | 207.6 | 203.8 | (1.9) |
| පිරිපහදු කළ ඛනිජ තෙල් | 204.6 | 257.0 | 25.6 | 829.9 | 1,054.0 | 27.0 |
| ගල්අඟුරු | 39.5 | 19.4 | (50.8) | 170.8 | 144.2 | (15.5) |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 49.6 | 98.9 | 99.5 | 224.6 | 474.0 | 111.0 |
| එයින් රත්‍රන් | 41.6 | 92.0 | 121.0 | 193.1 | 437.3 | 126.5 |
| මූල ලෝහ | 39.9 | 53.5 | 34.1 | 192.6 | 188.9 | (1.9) |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 193.9 | 191.6 | (1.2) | 860.6 | 882.7 | 2.6 |
| රසායනික නිෂ්පාදිත | 63.5 | 71.1 | 12.0 | 274.2 | 291.4 | 6.3 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 48.0 | 60.2 | 25.5 | 201.8 | 238.0 | 17.9 |
| කඩදාසි හා ඝන කඩදාසි | 30.7 | 36.9 | 20.1 | 137.1 | 159.6 | 16.3 |
| තිරිඟු හා ඉරිඟු | 35.2 | 23.0 | (34.5) | 117.8 | 130.2 | 10.6 |
| පොහොර | 2.8 | 13.8 | 397.1 | 22.6 | 88.5 | 291.0 |
| වෙනත් | 96.6 | 102.6 | 6.2 | 452.5 | 474.6 | 4.9 |
| **3. ආයෝජන භාණ්ඩ** | **372.5** | **394.7** | **6.0** | **1,614.6** | **1,590.7** | **(1.5)** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 185.7 | 215.6 | 16.1 | 871.9 | 866.9 | (0.6) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 134.3 | 121.3 | (9.7) | 524.1 | 499.7 | (4.7) |
| ප්‍රවාහන උපකරණ | 51.6 | 57.5 | 11.4 | 215.1 | 221.4 | 2.9 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.9 | 0.3 | (65.1) | 3.4 | 2.7 | (20.8) |
| **4. වර්ග නොකළ ආනයන** | **0.6** | **0.9** | **48.1** | **60.9** | **64.1** | **5.3** |
| **මුළු ආනයන** | **1,603.9** | **1,793.6** | **11.8** | **6,883.3** | **7,764.6** | **12.8** |


මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්


ඉන්දියාව, එක්සත් රාජධානිය සහ ඕස්ට්‍රේලියාව යන රටවලින් පැමිණෙන සංචාරකයන් සංඛ්‍යාවේ හිතකර වර්ධනය හේතුවෙන් 2018 වසරේ අප්‍රේල් මාසයේදී සංචාරක පැමිණීම්, 2017 වසරේ අප්‍රේල් මාසයට සාපේක්ෂව සියයට 12.6 කින් වර්ධනය විය. 2018 වසරේ පළමු මාස හතර තුළදී මුළු සංචාරක පැමිණීම් ප්‍රමාණය, 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 888,353 ක් දක්වා සියයට 16.1 කින් වර්ධනය විය. 2018 වසරේ අප්‍රේල් මාසයේදී සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 335 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇති අතර, 2018 වසරේ පළමු මාස හතර සඳහා මුළු සංචාරක ඉපැයීම් ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 1,647 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇත. මේ අතර, පසුගිය මාසය තුළදී දක්නට ලැබුණු වර්ධන ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින් 2018 වසරේ අප්‍රේල් මාසයේදී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ එ.ජ. ඩොලර් මිලියන 541 ක් දක්වා සියයට 10.9 කින් කැපීපෙනෙන ලෙස වර්ධනය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2018 වසරේ පළමු මාස හතර තුළදී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 2,520 දක්වා සියයට 5.0 කින් වර්ධනය විය.

**රූප සටහන 4 : සංචාරක පැමිණීම්හි ප්‍රධාන මූලාශ්‍ර පහ**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 5 : සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
බලපත්‍රලාභී වාණිජ බැංකු
ශ්‍රී ලංකා මහ බැංකුව

## මූල්‍ය ලැබීම්


ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ විදේශ විනිමය ගනුදෙනු ඇතුළත් කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන, 2018 වසරේ අප්‍රේල් මාසයේදී එ.ජ. ඩොලර් මිලියන 28.4 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2018 වසරේ පළමු මාස හතර තුළදී කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ මුළු ශුද්ධ විදේශීය ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 47.2 ක් විය. මේ අතර, භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළ වෙත වූ විදේශීය ශුද්ධ ලැබීම්, භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ වෙතින් වූ ශුද්ධ ගෙවීම්වලට වඩා වැඩි අගයක් වාර්තා කිරීම, 2018 වසරේ අප්‍රේල් මාසයේදී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි එ.ජ. ඩොලර් මිලියන 13.6 ක සමස්ත විදේශීය ශුද්ධ ලැබීමක් සඳහා

හේතු විය. තවද, 2018 වසරේ අප්‍රේල් මාසයේදී රජය වෙත වූ දිගුකාලීන ණය එ.ජ. ඩොලර් මිලියන 30.1 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

## ජාත්‍යන්තර සංචිත

ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව හේතුවෙන් 2018 වසරේ අප්‍රේල් මස අවසානය වන විට රටෙහි දළ නිල සංචිත මට්ටම මාස 5.5 ක ආනයන හා සමාන වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 9.9 ක් දක්වා වර්ධනය විය. බැංකු අංශයේ විදේශ වත්කම් ද ඇතුළත් මුළු විදේශීය වත්කම් ප්‍රමාණය 2018 වසරේ අප්‍රේල් මස අවසානය වන විට මාස 6.8 ක ආනයන ආවරණය සඳහා ප්‍රමාණවත් වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 12.3 ක් ලෙස වාර්තා විය.

**රූප සටහන 6 : දළ නිල සංචිත සහ සමස්ත ශේෂය**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

2018 ජූනි 28 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 3.7 කින් අවප්‍රමාණය විය. තවද, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල, කැනේඩියානු ඩොලරය, ඕස්ට්‍රේලියානු ඩොලරය සහ ඉන්දියානු රුපියල් හැර වෙනත් ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව අවප්‍රමාණය විය. ජාත්‍යන්තර වශයෙන් එ.ජ. ඩොලරයෙහි ශක්තිමත් වීම එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි අවප්‍රමාණය වීම කෙරෙහි යම්තාක් දුරකට බලපෑවේය.

## රූප සටහන 7 :
## එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 4 :
## තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම

| මුදල් ඒකකය | 2017 | 2018 ජුනි 28 දක්වා අධිප්‍රමාණය (+) / අවප්‍රමාණය (-) |
|---|---|---|
| එ.ජ. ඩොලරය | -2.0% | -3.7% |
| යුරෝ | -13.5% | -0.6% |
| ස්ටර්ලින් පවුම | -10.5% | -1.2% |
| ජපන් යෙන් | -5.1% | -5.9% |
| කැනේඩියානු ඩොලරය | -8.6% | +2.2% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -9.0% | +2.1% |
| ඉන්දියානු රුපියල | -7.5% | +3.2% |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව